සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம்

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2024
## අවසාන වාර පරීක්ෂණය

ලංකා ඉතිහාසය II
இலங்கை வரலாறு
Lanka History II

25 | S | II

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

පැය තුනයි
03 மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதி வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට 1978 දක්වා

උපදෙස්:
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.
* II කොටස A, B හා C ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
* A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
* B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් තෝරාගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
(පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ලංකාවේ දළ සිතියමක් I කොටස සමඟ සපයා ඇත.)

### A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| 1. පොළොන්නරුව | 2. බුන්දල | 3. මීගමුව | 4. ගම්පොළ |
| 5. දේවනගර | 6. කලාවැව | 7. ඌව පළාත | 8. සීගිරිය |
| 9. කන්තරෝඩෙයි | 10. සීතාවක | 11. ගාල්න නදිය | 12. කුරුණෑගල |

(ලකුණු 01 x 12 = 12)

### B කොටස

02. "ලංකා ඉතිහාසයේ සාහිත්‍ය මූලාශ්‍රය අතරින් මුදුන්මල්කඩ ලෙස සළකනු ලබන්නේ මහාවංශයයි"

(i) මහාවංශය රචනා වන්නේ කිනම් රාජ්‍ය කාල පරිච්ඡේදයක ද? (ලකුණු 01)

(ii) මහාවංශය රචනා කිරීම සඳහා පාදක කරගත් මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) අනුරාධපුර යුගයේ වංශකතා පිළිබඳ සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 04)

(iv) මහසෙන් රාජ්‍ය සමය අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා ඇති ප්‍රධානතම මූලාශ්‍රය ලෙස මහාවංශය සැළකිය හැකි වන්නේ කෙසේදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 09)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

03. වළගම්බා රජුට මුහුණ දීමට සිදු වූ අභියෝග හා ඔහු ඒවා ජයගත් ආකාරය විමසන්න.

(ලකුණු 16)

04. පොළොන්නරු යුගයේ පාලකයන්ගේ විදේශ ප්‍රතිපත්තිය පහත දැක්වෙන තේමා යටතේ විග්‍රහ කරන්න.

(i) විදෙස් රටවල් ආක්‍රමණය කිරීම.
(ii) විවාහ සබඳතා
(iii) සංස්කෘතික සබඳතා (ලකුණු 16)

05. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) දඹදෙණි යුගයේ සාහිත්‍ය
(ii) නිශ්ශංකමල්ල රජතුමාට මුහුණ දීමට සිදු වූ අභියෝග
(iii) අනුරාධපුර රාජධානියට එල්ල වූ දක්ෂිණ භාරතීය ආක්‍රමණ
(iv) ප්‍රාග් බෞද්ධ යුගයේ ඇදහිලි හා විශ්වාස (ලකුණු 8 x2 =16)

## C කොටස

06. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසි හා ලන්දේසි පාලනය හේතුකොට ගෙන ඇති වූ සාමාජීය හා සංස්කෘතික වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 16)

07. "1817 - 18 උඩරට බ්‍රිතාන්‍ය විරෝධී සටන ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ඇති වූ ප්‍රබලතම ජනතා නැගී සිටීමක් විය.

(i) බ්‍රිතාන්‍ය විරෝධී අරගලය ආරම්භ වූ ප්‍රදේශය නම් කරන්න. (ලකුණු 01)
(ii) මෙම සටනට නායකත්වය දුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)
(iii) එම සටන ඇති වීමට තුඩු දුන් හේතු පිළිබඳ කෙටි විස්තර කරන්න. (ලකුණු 04)
(iv) මෙම සටනින් උද්ගත වූ ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරමින් එය ශ්‍රී ලංකා ඉතිහාසයේ තීරණාත්මක අවස්ථාවක් වූ අයුරු පරීක්ෂා කරන්න. (ලකුණු 09)

08. ක්‍රි.ව. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වෙනස් වූ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 16)

09. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) 1956 මහ මැතිවරණය
(ii) 1815 උඩරට ගිවිසුම
(iii) 19 වන සියවසේ වතු වගාව
(iv) ගොවිජනපද ව්‍යාපාරය (ලකුණු 8 x2 =16)



PAST PAPERS WIKI
(2) WwW.PastPapers.WiKi (2)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!